# ඇබෑර්තු

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

### (තාක්ෂණ අමාත්‍යාංශය)

### අධ්‍යක්ෂ-ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ශ්‍රේණිය (HM 1-3)

## අධ්‍යක්ෂ (පරිපාලන) - 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් කළමනාකරණ, රාජ්‍ය පරිපාලන, රාජ්‍ය කළමනාකරණ, ව්‍යාපාර කළමනාකරණ හෝ මානව සම්පත් කළමනාකරණ (සිව් අවුරුදු) උපාධියක් ලබා තිබීම.

**සමග**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් ව්‍යාපාර පරිපාලනය, මානව සම්පත් කළමනාකරණ, කළමනාකරණ, රාජ්‍ය කළමනාකරණ හෝ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අදාළ වරලත් වෘත්තීය ආයතනයක වරලත් සාමාජිකත්වයක් ලබා තිබීම.

**අවශ්‍ය පළපුරුද්ද**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් අවුරුදු පහළොවක (15) කළමනාකරණ තලයේ අදාළ පළපුරුද්දක් ලබා තිබීම හා ඉන් වසර දෙකක් රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යේෂ්ඨ කළමනාකරණ තලයේ සනාථ කළ කාර්ය සාධනයක් සහිත සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**සහ**

බහුවිධ ක්ෂේත්‍රයන්හි කණ්ඩායම් හට නායකත්වය දීම හා යොමුකිරීම පිළිබඳ සනාථ කළ හැකියාවක් සමග මානව සම්පත් හා වෙනත් සම්පත් නිසි ලෙස ක්‍රියාවේ යෙදවීම හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 01 හෝ 02)**

01) ඉහත අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02) ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරෙහි අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම සමග ව්‍යාපාර කළමනාකරණ, මානව සම්පත් කළමනාකරණ, කළමනාකරණ හෝ රාජ්‍ය පරිපාලන අංශයේ පශ්චාත් උපාධි (ශාස්ත්‍රපති) සුදුසුකමක් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත ආයතනයකින් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අදාළ වරලත් වෘත්තීය ආයතනයක වරලත් සාමාජිකත්වයක් ලබා තිබීම.

**සහ**

බහුවිධ ක්ෂේත්‍රයන්හි කණ්ඩායම් හට නායකත්වය දීම හා ක්‍රියාවේ යොමුකිරීම පිළිබඳ සනාථ කළ හැකියාවක් සමග මානව සම්පත් හා වෙනත් සම්පත් නිසිලෙස ක්‍රියාවෙහි යෙදවීම හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව.

තෝරාගනු ලබන අයදුම්කරු මෙම ආයතනයේ පරිපාලන අංශය භාරව කටයුතු කළ යුතු අතර පරිපාලනමය ක්‍රියාකාරකම් සඳහා වගකීම් පැවරෙනු ඇත. ඔහු/ඇය හට සියළු අවස්ථාවන් හිදී කාර්ය මණ්ඩලයහට පහසුකම් සැළසීම සඳහා විශිෂ්ඨ නායකත්ව හා සන්නිවේදන හැකියාවන් සතුවිය යුතුය.

**වැටුප් පරිමාව** LKR 86,865.00 - 15 x 2,270.00 - LKR 120,915.00

**වයස**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

**අනෙකුත් වරප්‍රසාද**

1. රාජ්‍ය සමාගමේ චක්‍රලේඛ අංක PED 1/2015 හා PED 1/2015 (i) ප්‍රකාරව තනතුරට වාහනයක් හෝ ප්‍රවාහන දීමනාවක් හිමිවේ.
2. ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවනු ලැබේ.
3. ජීවිතාරක්ෂණ ආවරණය හා වෛද්‍ය රක්ෂණාවරණයක් හිමිවේ.
4. සීමාවකට යටත්ව බාහිර වෛද්‍ය වියදම් ගෙවනු ලැබේ.
5. මහා භාණ්ඩාගාරය මගින් අනුමත වාර්ෂික දිරිදීමනා ගෙවනු ලැබේ.
6. පිළිගත් වෘත්තීයමය වටපිටාවක රැකියාව කිරීමේ අවස්ථාව.
7. සන්නිවේදන දීමනාව.

සම්පූර්ණ නම, වයස, අධ්‍යාපනික සුදුසුකම් හා වෙනත් අදාළ විස්තර ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සමග ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරමින් **අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, නො. 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08** යන ලිපිනයට ලැබෙන පරිදි **2024.03.31** දිනට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. රාජ්‍ය අංශයේ ආයතනවල අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමුකළ යුතුය. අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සටහන් කළ යුතුය.


අධ්‍යක්ෂ ජනරාල්

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**

දුරකතන : 011-2671567 - 72